# <u>කළමනාකරණ කමිටු රැස්වීම</u>

**දිනය - 2023.05.24**

**වෙලාව - ප.ව. 3.00**

**ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප)**

**මූලාසනය - ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)**

**<u>සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය</u>**

1. ඩබ්ලිව් .එම්. දයාවතී මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
2. ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
3. ඒ.එම්.එස්.මල්කාන්ති මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)
4. කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)
5. කේ.ආර්.අබේසිරිවර්ධන මහතා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
6. කේ.ජී.එස්.ප්‍රසන්න මයා - ප්‍රධාන අභ්‍යන්තර විගණක
7. කේ.එන්.කේ.සිල්වා මිය - ආදායම් කොමසාරිස් (බ.ප)
8. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරී (ඉංජිනේරු)
9. පාලිත අබේවර්ධන මයා - ප්‍රධාන නීති නිලධාරී, නීති ඒකකය
10. එම්.ඩබ්ලිව්.එස්.කුරේ මයා - අධ්‍යක්ෂ (අය වැය)
11. කේ.ජී.සුදර්ම සිසිර කුමාර මයා - අධ්‍යක්ෂ (සැලසුම්)
12. ආර්.පී ගුණවර්ධන මිය - අධ්‍යක්ෂ (ගොඩනැගිලි)
13. ආශා පනාගොඩ මිය - අධ්‍යක්ෂ(ඉංජිනේරු)
14. ඒ.තලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු
15. කේ.එන්.සූරියආරච්චි මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති කළමනාකරණ කමිටු රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | පළාත් සභා කටයුතු වෙනුවෙන් ලැබෙන ප්‍රතිපාදන හා වියදම් සම්බන්ධව | පළාත් සභා කටයුතු වෙනුවෙන් ලැබෙන ප්‍රතිපාදන හා සිදු කරන වියදම් සම්බන්ධව සාකච්ඡා කරන ලදී. එහිදී සේවක වැටුප් ගෙවීම සඳහා මුදල් අමාත්‍යාංශය මඟින් සියලුම පළාත් සභා සඳහා ප්‍රමාණවත් මුදලක් ලබා නොදෙන බවත් , ඉතිරි මුදල පළාත් සභා අරමුදලින් දැරීමට සිදුවන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී .<br><br>තවද අතිකාල , ඉන්ධන , ජල විදුලිය , ආදිය සඳහා සිදු කරන වියදම් වෙනුවෙන් දැරීමට සිදුවන වැය හා එහි අපේක්ෂිත මුදල් සීමාව මත ඒවා ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් විමසා සිටි අතර මෙම වියදම් සම්බන්ධව ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය හා වියදම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනිම සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලයේ හා අනිකුත් අමාත්‍යාංශ හා ආයතනවල වියදම් වාර්තාවන් මීළඟ කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මූල්‍ය/ සැලසුම්) |
| 02. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා නව පත්වීම් ලබා දෙන ලද බහුකාර්ය සේවකයින් පත් කිරීම සම්බන්ධව | ප්‍රධාන ලේකම් කාර්යාලයේ පවතින කාර්යාල කාර්ය සහයක පුරප්පාඩු වෙනුවෙන් නව පත්වීම් ලබා දෙන බහුකාර්ය සහයකයින් පත් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.<br>ඒ අනුව ප්‍රධාන ලේකම් පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවයේ නියුතු කාර්යාල කාර්ය සහයක හංසි නිමාෂා මිය වෙත වෙනත් පහසු සේවා ස්ථානයක් ලබා දීමට කටයුතු කර එම කාර්යාලය වෙත වෙනත් සුදුසු කාර්යාල කාර්ය සහයකයෙකු ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) වෙත උපදෙස් ලබා දෙන ලදී.<br>තවද විගණන අංශයට සභා ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු කාර්යාල කාර්ය සහයකයකු දැනට තාවකාලිකව පත්කර ඇති අතර එම අංශයට ස්ථිර කාර්යාල කාර්ය සහයකයකු පත් කිරීමට කටයුතු කිරීමටත්, ඉංජිනේරු අංශයේ හා පාලන අංශයේ නීති ඒකකයේ පවතින පුරප්පාඩු සඳහා කණිෂ්ඨ කාර්ය මණ්ඩල සේවකයන් පත් කිරීමට උපදෙස් ලබා දුන් අතර එක් එක් අංශ සඳහා පවතින පුරප්පාඩු සම්බන්ධව සාකච්ඡා කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 03. | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ වායු සමීකරණ නඩත්තු කටයුතු සඳහා දැනට සේවයේ යෝදවා ඇති අයට ස්ථිර පත්වීමක් ලබා දීම සම්බන්ධව | මෙම ගොඩනැගිල්ලේ වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු කටයුතු සඳහා කඩත්තු ඉංජිනේරු අංශයට අනුයුක්තව පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ තදුපීත පදනම මත බඳවාගත් සේවකයෙකු යොදවාගෙන ඇති අතර එම සේවය ලබා ගැනීම සඳහා වාර්ෂිකව එම ආයතනයට මුදල් ගෙවීම සිදු කරයි. නමුත් පළාත් සභා ගොඩනැගිල්ල ඉදි කරන අවස්ථාවේදී සිටම එම කටයුතු සඳහා මෙම සේවක මහතා බඳවා ගෙන ඇති අතර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ඔහුගේ සේවය ලබා ගැනීමට කටයුතු කරන ලදී. එසේම ඔහු කිසි දිනක මාර්ග සංවර්ධන අධිකාරියේ වෙනත් කටයුත්තක සේවයේ යෙදී නොමැත. ඔහු එම ආයතනයේ නිත්‍ය සේවකයෙකු නොවන අතර ලබන වසර සඳහාද එම ආයතනයට මුදල් ගෙවා ඔහුගේ සේවය ලබා ගැනීමට සිදුවන බැවින් ඔහුගේ සුදුසුකම් වලට අනුව පවතින පුරප්පාඩුවක් සඳහා ඔහු ඉංජිනේරු අංශයට බඳවා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>මෙම බඳවා ගැනීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමුකළ නමුත් එම අවස්ථාවේදී පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ අනෙකුත් සේවකයන්ගෙන් ගැටළුවක් මතුවිය හැකි බවට ගැටළුවක් පැන නැගුණු බැවින් එය සිදුකිරීමට නොහැකි වූ බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>ඒ අනුව ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡාකර ඒ පිළිබඳ දැනුවත් කිරීමෙන් පසු එය ඉදිරිපත් කිරීම සුදුසු බැවින් සියලු තොරතුරු ඇතුලත් කර නැවත අනුමැතියට ලිපියක් ඉදිරිපත් කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු / ඉංජිනේරු) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 04. | කාර්යාල වලින් බැහැර කරනු ලබන ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ඉවත් කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටා ඇති කාර්යාල වලින් බැහැර කරනු ලබන ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටළුවක් පවතින බවත් කාර්යාල වලින් ඉවත් කරන රිජිෆෝම් හා ඉලෙක්ට්රෝනික අපද්‍රව්‍ය වාහන නැවතා තැබීම සඳහා වෙන්කර ඇති P මහලෙහි ගොඩගසා ඇති බවත් , නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙහි ක්‍රමවේදයක් සකස් විය යුතු අතර එම අපද්‍රව්‍ය බැහැර කිරීමේ කටයුතු අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙත පැවරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>ඒ අනුව බස්නාහිර පළාත් සභාවට අයත් සියලුම ආයතනවල ඉවතලන ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ නිලධාරීන් සමඟ සාකච්ඡා කර ඔවුන් විසින් දැනුම් දෙනු ලබන පරිදි මසකට දින දෙකක් වෙන් කර මෙම පරිශ්‍රයේදී ඔවුන් වෙත භාර දීමට හෝ නැතහොත් ආයතන විසින් පෞද්ගලිකව ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය එක් රැස් කොට සතියේ කාර්යාල දිනයකදී කරදියාන අපද්‍රව්‍ය බැහැර කිරීමේ මධ්‍යස්ථානයට භාර දීමට කටයුතු කරන ලෙස සියලුම බස්නාහිර පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන දැනුවත් කරන ලෙසත් මේ සම්බන්ධව අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සභාපති වෙත ලිඛිතව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 05. | නඩත්තු වැය විෂය යටතේ ලබා දී ඇති ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධව සැලසුම් අංශයෙන් සකස් කරන ලද පරිගණක දත්ත පද්ධතිය සම්බන්ධව | මෙම මුදල් වෙන් කිරීම සම්බන්ධව තොරතුරු ඇතුලත් කිරීම සඳහා පරිගණක දත්ත පද්ධතියක් සකස්කර අවසන් කර ඇති බවත්, පළාත් සභා ගොඩනැගිල්ල තුල ඕනෑම ආයතනයකට ඒ සඳහා තොරතුරු ඇතුලත් කල හැකි අතර ගොඩනැගිල්ලෙන් පිටත ආයතනවලට එයට ප්‍රවේශ වීමේ හැකියාවක් නොමැති බැවින් ඒ සඳහාද පහසුකම් සැලසීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවටත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 06. | ආදායම් දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් සම්බන්ධව | ආදායම් දෙපාර්තමේන්තුව සඳහා අලුතින් සකස් කරන ලද ඉදිරිපස කාර්යාලය මහජන සේවය සඳහා උපරිම වශයෙන් යොදා ගැනීමට කටයුතු කරන ලෙස ආදායම් කොමසාරිස් වෙත ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br><br>ආදායම් දෙපාර්තමේන්තුවේ අලුතින් ඉදි කිරීමට හා අලුත්වැඩියා කළයුතු අංශ පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර ගොඩනැගිල්ල තුල ඉදි කිරීමට ඇති කොටස් හා සකස් විය යුතු වැසිකිළි අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතිය සම්බන්ධව ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරිපත් කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>එමෙන්ම ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ යතුරු පැදි නවතා තැබීම සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් අවධානය යොමුකළ අතර එම යතුරු පැදි නවතා තැබීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්/ ඉංජිනේරු) |
| 07. | රත්මලාන ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ රියදුරු ස්ථාන මාරු කිරීම සම්බන්ධව | රත්මලාන ප්‍රාදේශීය ඉංජිනේරු විසින් එම කාර්යාලයේ සේවයේ නියුතු රියදුරු සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති පැමිණිල්ලට අනුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙතින් වාර්තාවක් ලබා ගෙන සේවා අවශ්‍යතාව මත එම රියදුරු වහාම ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරු කිරීම සඳහා ප්‍රධාන ලේකම් විසින් අනුමැතිය ලබා දෙන ලදී.<br>තවද ඔහුගේ ක්‍රියාවන් සම්බන්ධව විනය පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන ලෙසද ප්‍රධාන ලේකම් විසින් වැඩිදුරටත් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු / පාලන) |
| 08. | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ අලුත් වැඩියා කටයුතු සම්බන්ධව | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිළිසකර කිරීම් සම්බන්ධව සාකච්ඡා කළ අතර ඒ අනුව විදුලි සෝපානයට පිවිසෙන ස්ථාන, ගොඩනැගිල්ලේ ඉදිරිපස හා පිටුපස පිවිසුම් ආලින්ද ඇතුලුව ස්ථාන කිහිපයක වර්ණ ආලේප කිරීමට කටයුතු සූදානම් කරන බව මූලස්ථාන ඉංජිනේරු විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව මේ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවද යෝජනා විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) මූලස්ථාන ඉංජිනේරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 09. | ඩෙංගු මර්දන කටයුතු සඳහා මදුරුවන් බෝවන ස්ථාන පරීක්ෂා කිරීම සම්බන්ධව | ඩෙංගු මර්දන කටයුතු සඳහා ආයතනවල ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන පරීක්ෂා කිරීමේ කාර්ය වෙනුවෙන් තම ආයතනයට ගොඩනැගිල්ලේ අභ්‍යන්තර පරීක්ෂා කිරීමේ කටයුතු පවරා ඇති අතර එම නිලධාරීන් සඳහා ගොඩනැගිල්ලෙන් බාහිර ආයතන හා ස්ථාන පරීක්ෂා කිරීමටද අවස්ථාවක් ලබා දෙන ලෙස අධ්‍යක්ෂ සැලසුම් විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී.<br>එමෙන්ම බාහිර ස්ථාන හා අභ්‍යන්තරික ස්ථාන සම්බන්ධව ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන පරීක්ෂා කිරීම කෙරෙහි සිදු කරන වැඩපිළිවල සම්බන්ධව සාකච්ඡා කරන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 10. | බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයෙහි බැහැර කරන අපද්‍රව්‍ය ඉවත් කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලෙහි බැහැර කරන ඉඳුල් හා අනෙකුත් අපද්‍රව්‍ය මෙම ගොඩනැගිලි පරිශ්‍රයෙන් ඉවත් කිරීමේ කටයුතු කඩුවෙල මහ නගර සභාව මඟින් සිදු කරනු ලබයි.ඒ අනුව එම අපද්‍රව්‍ය සති අන්ත දිනවල ඉවත් කිරීමක් සිදු නොවන බැවින් නිවාඩු දින දෙකක් පුරා මෙම පරිශ්‍රයෙහි ගබඩා කර ගැනීමට සිදුවේ. එම නිසා සිකුරාදා දින වලදී එම අපද්‍රව්‍ය ඉවත් කිරීම සුදුසු බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>මේ සම්බන්ධව සාකච්ඡා කිරීමෙන් අනතුරුව සිකුරාදා හා බදාදා දිනවල එම අපද්‍රව්‍ය ඉවත් කිරීමට කටයුතු කිරීම සුදුසු බව තීරණය කළ අතර එසේ කටයුතු කරන ලෙස කඩුවෙල මහ නගර සභාව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 11. | කාර්ය සාධන තරඟාවලිය සම්බන්ධව | ප්‍රධාන ලේකම් කාර්යාලයේ සියලුම අංශ කාර්ය සාධන තරඟාවලියට ඉදිරිපත් වීම කෙරෙහි ප්‍රධාන ලේකම් විසින් විමසා සිටි අතර සියලුම අංශ ඒ සඳහා පූර්ව සූදානම්ව කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා අංශ ප්‍රධානීන් |

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත